# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2416/08 - 2024 දෙසැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ගම්පොල නගර සභා බල ප්‍රදේශය, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය, අනුර කරුණාතිලක වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 අප්‍රේල් මස 09 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, ගම්පොල නගර සභා බල ප්‍රදේශය, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම.),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 17 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර II,
බත්තරමුල්ල.

EOG 12 - 0234/1


1A - PG 6955 — 19 (2024/12)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ගම්පොල නගර සභා බල ප්‍රදේශය, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, ගම්පොල නගර සභා බල ප්‍රදේශය, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම 2024 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**අනුර කරුණාතිලක** (පා.ම.),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 20 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

EOG 12 - 0234/2

---

**ගම්පොල නගර සභා බල ප්‍රදේශය, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ බලතල ප්‍රකාරව ගම්පොල නගර සභා බල ප්‍රදේශය, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 දෙසැම්බර් මස 17 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

*ඉංජි.* **එල්. බී. කුමුදු ලාල්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2024 දෙසැම්බර් මස 20 වැනි දින.

EOG 12 - 0234/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.